# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 643/4 — 1991 ජනවාරි 01 වැනි අඟහරුවාදා — 1991.01.01

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (අ) වැනි කොටස—පළාත් සභා

## පළාත් සභා නිවේදන

### 1990 අංක 13 දරන මුදල් ප්‍රඥප්තිය—උතුරු මැද පළාත් සභාව

1(1) වගන්තිය යටතේ නියෝගය

උතුරු මැද පළාතේ පළාත් සභාවේ 1990 අංක 13 දරන මුදල් ප්‍රඥප්තියේ 1 (1) දරන වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, උතුරු මැද පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ නීතිය හා සාමය, මුදල් හා ක්‍රම සම්පාදනය, පළාත් පරිපාලනය, හා පිරිස් පාලනය ඉඩම් වාරිමාර්ග හා කෘෂිකර්ම කටයුතු පිළිබඳ ඇමති ගමගේ දොන් මහින්දසෝම වන මම, 1991 ජනවාරි මස 01 වන දින මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක විය යුතු දිනය වශයෙන් මෙම නියෝගය මගින් නියම කරමි.

ජී. ඩී. මහින්දසෝම,
උතුරු මැද පළාතේ පළාත් සභාවේ මන්ත්‍රී, ප්‍රධාන අමාත්‍ය සහ නීතිය හා සාමය, මුදල් හා ක්‍රම සම්පාදනය, පළාත් පරිපාලනය හා පිරිස් පාලනය, ඉඩම් වාරිමාර්ග හා කෘෂිකර්ම කටයුතු පිළිබඳ ඇමති.

1990 දෙසැම්බර් මස 30 වැනි දින,
අනුරාධපුරයේදී ය.

01–192/1

---

### 1990 අංක 13 දරන මුදල් ප්‍රඥප්තිය—උතුරු මැද පළාතේ පළාත් සභාව

7 (1) වගන්තිය යටතේ නියෝගය

උතුරු මැද පළාතේ පළාත් සභාවේ 1990 අංක 13 දරන මුදල් ප්‍රඥප්තියේ IV වන පරිච්ඡේදයේ 7 (1) දරන වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, උතුරු මැද පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ නීතිය හා සාමය, මුදල් හා ක්‍රම සම්පාදනය,/පළාත් පරිපාලනය හා පිරිස් පාලනය ඉඩම් වාරිමාර්ග හා කෘෂිකර්ම කටයුතු පිළිබඳ ඇමති ගමගේ දොන් මහින්දසෝම වන මම පහත සඳහන් පිරිවැටුම් බදු අනුප්‍රමාණයන් මෙම නියෝගය මගින් 1991 ජනවාරි මස 1 වන දින සිට නියම කරමි.

(අ) මැණික් විකිණීමේ ව්‍යාපාරයේ පිරි වැටුම් සම්බන්ධයෙන්
05%
(ආ) ඉරන ලද ලී හෝ ලීකොට වශයෙන් දැව විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන්
05%
(ඉ) වටිනා හෝ අර්ධ වශයෙන් වටිනා ගල් විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන්
05%
(ඊ) රත්‍රං විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන්
05%

F 1—CP13047 –975 (91/10)

| | |
|---|---|
| (උ) ලී බඩු විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් | 05% |
| (ඌ) ස්වර්ණාභරණ සහ ඇඳුම් ආයිත්තම් සඳහා වූ ස්වර්ණාභරණ විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් | 10% |
| (එ) ඉහත (අ), (ආ), (ඉ), (ඊ), (උ) (ඌ) යටතේ සඳහන් යම් ව්‍යාපාරයක් හැර යම් ද්‍රව්‍යයක් හෝ වෙළඳ ද්‍රව්‍යයන් මිළදී ගැනීමේ සහ විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් | 01% |

ජී. බී. මහින්දසෝම,

උතුරු මැද පළාතේ පළාත් සභාවේ මන්ත්‍රී ප්‍රධාන ආමාත්‍ය සහ නීතිය හා සාමය මුදල් හා ක්‍රම සම්පාදන පළාත් පරිපලනය හා පිරිස් පාලනය ඉඩම්, වාරිමාර්ග හා කෘෂිකර්ම කටයුතු පිළිබඳ ඇමති.

1990 දෙසැම්බර් මස 30 වන දින,
අනුරාධපුරයේදී ය.
01–192/2

---

1990 අංක 13 දරන මුදල් ප්‍රඥප්තිය—උතුරු මැද පළාතේ පළාත් සභාව

5 (1) වගන්තිය යටතේ නියෝගය

උතුරු මැද පළාතේ පළාත් සභාවේ 1990 අංක 13 දරන මුදල් ප්‍රඥප්තියේ 5 (1) දරන වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, උතුරු මැද පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ නීතිය හා සාමය මුදල් හා ක්‍රම සම්පාදනය පළාත් පරිපාලනය හා පිරිස් පාලනය ඉඩම් වාරිමාර්ග හා කෘෂිකර්ම කටයුතු පිළිබඳ ඇමති ගමගේ දොන් මහින්දසෝම වන මම මෙම නියෝගය මගින් පහත සඳහන් කරුණු 1991 ජනවාරි 01 දින සිට පිරිවැටුම් බද්දෙන් නිදහස් කරමි.

(අ) යම් නිෂ්පාදිත හෝ සකස් කළ ද්‍රව්‍යයන් අපනයනය කිරීම සඳහා වූ ව්‍යාපාරයක් ;

(ආ) වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යන යම් දෙපාර්තමේන්තුවක් හැර වෙනත් යම් රජයේ දෙපාර්තමේන්තුවක් ;

(ඉ) යම් ප්‍රාදේශීය බල මණ්ඩලයක්.

ජී. බී. මහින්දසෝම,

උතුරු මැද පළාතේ පළාත් සභාවේ මන්ත්‍රී ප්‍රධාන අමාත්‍ය සහ නීතිය හා සාමය, මුදල් හා ක්‍රමසම්පාදනය, පළාත් පරිපාලනය, හා පිරිස් පාලනය ඉඩම් වාරිමාර්ග හා කෘෂිකර්ම කටයුතු පිළිබඳ ඇමති.

1990 දෙසැම්බර් මස 30 වැනි දින,
අනුරාධපුරයේදී ය
01–192/3

---

1990 අංක 13 දරන මුදල් ප්‍රඥප්තිය—උතුරු මැද පළාතේ පළාත් සභාව

8 වගන්තිය යටතේ නියෝගය

උතුරු මැද පළාතේ පළාත් සභාවේ 1990 අංක 13 දරන මුදල් ප්‍රඥප්තියේ 8 දරන වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, උතුරු පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ නීතිය හා සාමය, මුදල් හා ක්‍රම සම්පාදනය, පළාත් පරිපාලනය හා පිරිස් පාලනය ඉඩම් වාරිමාර්ග හා කෘෂිකර්ම කටයුතු පිළිබඳ ඇමති ගමගේ දොන් මහින්දසෝම වන මම මෙම නියෝගය මගින් පහත සඳහන් ද්‍රව්‍ය 1991 ජනවාරි 01 දින සිට නිදහස් කළ ද්‍රව්‍ය වශයෙන් ප්‍රකාශ කරමි.

(අ) පොත් (සඟරා, වාර සඟරා සහ ප්‍රවෘත්ති පත්‍ර හැර)
(ආ) පාන්
(ඇ) කරදමුංගු
(ඈ) කරාබුනැටි
(ඉ) කුරුඳු
(ඊ) බොරතෙල් සහ ගුවන් නැව් ඉන්ධන
(උ) බෙහෙත් ද්‍රව්‍ය
(ඌ) අමු තේ දළු
(එ) සාදික්කා
(ඒ) වියළි පැපොල් කිරි
(ඔ) ගම්මිරිස්
(ඕ) රබර්

(ක) විදේශ තානාපති දූත මණ්ඩල වලට සහ එම දූත මණ්ඩලවල තානාපති කාර්ය මණ්ඩල සාමාජිකයන්ට විකුණනු ලබන පැට්‍රල්

(ඛ) ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් හෝ යම් ප්‍රාදේශීය බල මණ්ඩලයක් විසින් විකුණනු ලබන ජලය

(ග) විදේශීය මුදල් මගින් ගනුදෙනු කිරීම සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලය දෙනු ලැබූ යම් පුද්ගලයකු විසින් විදේශීය මුදලින් ගෙවීම සඳහා විකුණනු ලබන ස්වර්ණාභරණ සහ මැණික්.

ජී.ඩී. මහින්දසෝම,
උතුරු මැද පළාතේ පළාත් සභාවේ මන්ත්‍රී,
ප්‍රධාන අමාත්‍ය සහ නීතිය හා සාමය මුදල් හා ක්‍රම සම්පාදනය පළාත් පරිපාලනය හා පිරිස් පාලනය, ඉඩම් වාරිමාර්ග හා කෘෂිකර්ම කටයුතු පිළිබඳ ඇමති.

1990 දෙසැම්බර් මස 30 වැනි දින,
අනුරාධපුරයේදී ය.

01–192/4

---

**1990 අංක 13 දරන මුදල් ප්‍රඥප්තිය—උතුරු මැද පළාතේ පළාත් සභාව**

76 (1) වගන්තිය යටතේ නියෝගය

උතුරු මැද පළාතේ පළාත් සභාවේ 1990 අංක 13 දරන මුදල් ප්‍රඥප්තියේ 76 (1) දරන වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර උතුරු මැද පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ නීතිය හා සාමය, මුදල් හා ක්‍රම සම්පාදනය පළාත් පරිපාලනය හා පිරිස්පාලනය ඉඩම් වාරිමාර්ග හා කෘෂිකර්ම කටයුතු පිළිබඳ ඇමති ගමගේ දොන් මහින්දසෝම වන මම එම ප්‍රඥප්තියේ 37 (අ) (ආ) සහ (ඉ) දරන වගන්තිවල සඳහන් ලේඛන සහ ලියකියවිලි පිළිබඳ මුද්දර ගාස්තු ගෙවීම සඳහා මෙම නියෝගයෙහි විස්තර කෙරෙන අලවන මුද්දර 1991 ජනවාරි 01 වන දින සිට පාවිච්චි කරන ලෙස ප්‍රකාශ කරමි.

එන්. සී. පී. පී. සී. යන ඉංග්‍රීසි අකුරු මතුපිට මුද්‍රණය කරනු ලැබ ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් දැනටමත් නිකුත් කොට තිබෙන රුපියල් 50 (පනහ) රුපියල් 100 (සියය) රුපියල් 500 (පන්සියය) සහ රුපියල් 1,000 (දාහ) යන වටිනාකමින් යුත් අලවන මුද්දර

ජී. ඩී. මහින්දසෝම,
උතුරු මැද පළාතේ පළාත් සභාවේ මන්ත්‍රී,
ප්‍රධාන අමාත්‍ය සහ නීතිය හා සාමය ,මුදල් හා ක්‍රම සම්පාදනය, පළාත් පරිපාලනය හා පිරිස්පාලනය, ඉඩම්වාරිමාර්ග හා කෘෂිකර්ම කටයුතු පිළිබඳ ඇමති.

1990 දෙසැම්බර් මස 30 වැනි දින,
අනුරාධපුරයේදී ය.

01–192/5

---

**1990 අංක 13 දරන මුදල් ප්‍රඥප්තිය—උතුරු මැද පළාතේ පළාත් සභාව**

96 (1) වගන්තිය යටතේ නියෝගය

උතුරු මැද පළාතේ පළාත් සභාවේ 1990 අංක 13 දරන මුදල් ප්‍රඥප්තියේ 96 (1) දරන වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, උතුරු මැද පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ නීතිය සාමය, මුදල් හා ක්‍රම සම්පාදනය, පළාත් පාලනය හා පිරිස් පාලනය ඉඩම් වාරිමාර්ග හා කෘෂිකර්ම කටයුතු පිළිබඳ ඇමති ගමගේ දොන් මහින්දසෝම වන මම 1991 ජනවාරි මස 01 වන දින සිට සියයට 05 ක බද්දක් මෙම නියෝගය මගින් නියම කරමි.

ජී. ඩී. මහින්දසෝම,
උතුරු මැද පළාතේ පළාත් සභාවේ මන්ත්‍රී,
ප්‍රධාන අමාත්‍ය සහ නීතිය හා සාමය, මුදල් හා ක්‍රම සම්පාදනය, පළාත් පරිපාලනය හා පිරිස් පාලනය, ඉඩම් වාරිමාර්ග හා කෘෂිකර්ම කටයුතු පිළිබඳ ඇමති.

1990 දෙසැම්බර් මස 30 වැනි දින,
අනුරාධපුරයේදී ය.

01-192/6

---

**1990 අංක 13 දරන මුදල් ප්‍රඥප්තිය—උතුරු මැද පළාතේ පළාත් සභාව**

උතුරු මැද පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ නීතිය හා සාමය, මුදල් හා ක්‍රමසම්පාදනය පළාත් පරිපාලනය හා පිරිස්පාලනය, ඉඩම් වාරිමාර්ග හා කෘෂිකර්ම කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් 1990 අංක 13 දරන මුදල් ප්‍රඥප්තියේ 37 දරන වගන්තිය සමග කියවෙන එම ප්‍රඥප්තියේ 77 (1) (අ) දරන වගන්තිය යටතේ සම්පාදනය කරන ලද රෙගුලාසිය.

ජී. ඩී. මහින්දසෝම,
උතුරු මැද පළාතේ පළාත් සභාවේ මන්ත්‍රී, ප්‍රධාන අමාත්‍ය සහ නීතිය හා සාමය, මුදල් හා ක්‍රමසම්පාදනය, පළාත් පරිපාලනය හා පිරිස්පාලනය, ඉඩම් වාරිමාර්ග හා කෘෂිකර්ම කටයුතු පිළිබඳ ඇමති.

1990 දෙසැම්බර් 30 වැනි දින,
අනුරාධපුරයේදී ය.

රෙගුලාසිය

(අ) මෙහි ඇති උපලේඛනයේ I වන තීරයෙහි සඳහන් සෑම ලේඛනයක්ම සඳහා එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනෙහි දක්වෙන ගාස්තු ප්‍රමාණයන් අනුව ; සහ

(ආ) මෙහි ඇති උපලේඛනයේ I වන තීරයෙහි සඳහන් සෑම ලියවිල්ලක්ම සඳහා එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනෙහි දක්වෙන ගාස්තු ප්‍රමාණයන් අනුව,

1991 ජනවාරි 01 වන දින සිට මුද්දර ගාස්තු අය කළ යුතු වේ.

## උපලේඛනය

I වන තීරය

| විෂය අංක | | II වන තීරය රු. ශත |
|---|---|---|
| 1. | (I) සම උරුමක්කාරයන් අතර හැර, යම් දේපළක් හුවමාරු කිරීම සඳහා වූ ඔප්පුවක් හෝ ලේඛනයක්— | |
| | (i) (අ) සමාන වටිනාකමින් යුතුවේ නම්, දේපල පිළිබඳව වෙළඳපොළෙහි පවත්නා වටිනාකමට පවරනු ලබන දේපලක් සම්බන්ධයෙන් අයත් ගාස්තුවම ; | |
| | (ii) (ආ) සමාන නොවන වටිනාකමින් යුතු වේ නම්, වඩා ඉහළ වටිනාකමින් යුත් දේපළ පවරාදීමේදී මෙන්ම වෙළඳ පොළෙහි පවත්නා එහි වටිනාකමට අනුකූලවන්නා වූ ගාස්තුවම ; | |
| | (II) සම උරුමක්කාරයන් අතර යම් දේපළක් හුවමාරු කිරීම සඳහා වූ ඔප්පුවක් හෝ ලේඛනයක්— | |
| | (අ) සමාන වටිනාකමින් යුතුවේ නම් ... ... ... ... ... ... | 10 0 |
| | (ආ) සමානකම් සඳහා මුදල් පිළිබඳ සැලකිල්ලක් දක්වනු ලැබේ නම්, හුවමාරු කරගනු ලබන දේපළ පිළිබඳ වෙළඳ පොලේ වටිනාකම්වල වෙනසට සමාන වන කල්හි එම දේපළ හුවමාරු කිරීමේදී අදාළවන ගාස්තුවම ; | |
| 2. | ත්‍යාගයක් හෝ යම් දේපළක් පිළිබඳ තෑගි ඔප්පුවක්— | |
| | (අ) දේපලෙහි වටිනාකම රු. 50,000ක් හෝ ඊට වඩා අඩු නම්, සෑම රු. 100ක් හෝ ඉන් කොටසක් සඳහා ... ... | 3 0 |
| | (ආ) දේපලෙහි වටිනාකමට රු. 50,000කට වඩා වැඩි නම්, පළමු රු. 50,000 සඳහා ... ... ... | 1,500 0 |
| | වටිනාකම රු. 50,000ට වැඩි සෑම රු. 100ක්ම සඳහා ... ... ... ... | 2 0 |
| 3. | (අ) තෑගි දීමකින් හැර මියගිය තැනැත්තෙකුගේ දේපල පිළිබඳ බලකාරයෙකු හෝ අද්මිනිස්ත්‍රාත්කරුවෙකුගේ සැලකිල්ලක් නොමැතිව එම දේපලවලට අර්ථලාභියෙකු වශයෙන් හිමිකම තිබෙන පුද්ගලයෙකුට හෝ මියගිය තැනැත්තාගේ කැමැත්ත පරිදි පත් කරන ලද භාරකාරයෙකුට යම් නිශ්චල දේපලක් පවරාදීම හෝ හිමිකරදීම හෝ භාරකාරයෙකු විසින් අර්ථලාභියෙකුට හෝ උසාවියේ නියෝගයකින් විවාහයකට අදළ නඩු විභාගයකදී පවරාදීම හෝ හිමිකරදීම— | |
| | (i) රු. 1,00,000ට නොවැඩි වටිනාකමින් යුතුවන විට, එම වටිනාකමෙහි සෑම රු. 100ක් සඳහා ... ... | 3 0 |
| | (ii) වටිනාකම රු. 1,00,000ට වැඩිවන විට රු. 100කට හෝ ඉන් කොටසකට ... ... ... | 4 0 |
| | (ආ) තෑගි දීමකින් හැර මියගිය තැනැත්තෙකුගේ දේපල පිළිබඳ බලකාරයෙකු හෝ අද්මිනිස්ත්‍රාත්කරුවෙකුගේ සැලකිල්ලක් සොමැතිව එම දේපලවලට අර්ථලාභියෙකු වශයෙන් හිමිකම තිබෙන පුද්ගලයෙකුට හෝ මියගිය තැනැත්තාගේ කැමැත්ත පරිදි පත් කරන ලද භාරකාරයෙකුට යම් චංචල දේපලක් පවරාදීම හෝ හිමිකරදීම හෝ භාරකාරයෙකු විසින් අර්ථලාභියෙකුට හෝ උසාවියේ නියෝගයකින් විවාහයකට අදළ නඩු විභාගයකදී පවරාදීම හෝ හිමිකරදීම— | |
| | වටිනාකමෙහි සෑම රු. 100ක් හෝ ඉන් කොටසක් සඳහා ... ... ... ... ... | 3 0 |
| 4. | ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ හෝ අද්මිරාල්ටි අධිකරණ බලය ක්‍රියාවේ යොදවන විටකදී මහාධිකරණයක හෝ සිවිල් නීති කෘත්‍යයකදී ඉදිරිපත් කරනු ලබන එක් එක් ලියවිල්ලක් සඳහා— | |
| | (අ) නීතිකෘත්‍යයේ වටිනාකම රු. 10,00,000 ඉක්මවන විටකදී, සෑම රු. 1,000ක් හෝ ඉන් කොටසකට ... ... | 2 0 |
| | (ආ) නීතිකෘත්‍යයේ වටිනාකම රු. 10,00,000 ඉක්මවන විටකදී ... ... ... ... ... | 2,000 0 |
| 5. | දිස්ත්‍රික් උසාවියක සිවිල් නීතිකෘත්‍යයක් සඳහා ඉදිරිපත් කරනු ලබන එක් එක් ලියවිල්ලක් සඳහා— ... | |
| | (අ) නීතිකෘත්‍යයේ වටිනාකම රු. 10,00,000 නොඉක්මවන විටකදී, එක් එක් රු. 1,000 හෝ ඉන් කොටසකට ... ... | 1 0 |
| | (ආ) නීති කෘත්‍යයේ වටිනාකම රු. 10,00,000 ඉක්මවන විටකදී ... ... ... ... | 1,000 0 |

01—192/7

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

# The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

EXTRAORDINARY

අංක 643/4 — 1991 ජනවාරි 01 වැනි අඟහරුවාදා — 1991.01.01

No. 643/4—TUESDAY, JANUARY 01, 1991

(Published By Authority)


## PART IV (A) — PROVINCIAL COUNCILS

### Provincial Council Notifications

FINANCIAL STATUTE No. 13 OF 1990

Provincial Council North Central Province

ORDER UNDER SECTION 1 (I)

BY virtue of the powers vested in me by Section 1 (I) of the Financial Statute No. 13 of 1990, Provincial Council, North Central Province, I, Gamage Don Mahindasoma, Chief Minister and Minister of Law and Order, Finance and Planning, Provincial Administration and Personnal, Land, Irrigation and Agriculture, North Central Province, Provincial Council, do by this order appoint 1st January, 1991, as the date on which this statute shall come into operation.

G. D. MAHINDASOMA,
Chief Minister and Minister of
Law and Order, Finance and Planning,
Provincial Administration and
Personnel, Land, Irrigation and
Agriculture, North Central Province.

Anuradhapura,
30th December, 1990.

01–192/1

---

FINANCIAL STATUTE No. 13 OF 1990

Provincial Council North Central Province

ORDER UNDER SECTION 7 (I)

BY virtue of the powers vested in me by Section 7(I) of the Financial Statute No. 13 of 1990, Provincial Council, North Central Province I, Gamage Don Mahindasoma, Chief Minister and Minister of Law and Order, Finance and Planning, Provincial Administration and Personnel Land, Irrigation and Agriculture, North Central Province, Provincial Council, do by this order with effect from 1st January 1991 fix the following rates of Turnover Tax :—

| | |
|---|---|
| (a) in respect of the turnover of the business of selling Gems | 05 per centum |
| (b) in respect of the turnover of the business of selling Timber whether Sawn or in the form of Logs | 05 per centum |
| (c) in respect of the turnover of the business of selling precious or semi-precious stone | 05 per centum |
| (d) in respect of the turnover of the business of selling Gold | 05 per centum |
| (e) in respect of the turnover of the business of selling Furniture | 05 per centum |
| (f) in respect of the turnover of the business of selling Jewellery and costume Jewellery | 10 per centum |
| (g) in respect of the turnover of the business of buying and selling any article or commodity other than any business referred to under (a), (b), (c), (d), (e), (f) above | 01 per centum |

G. D. MAHINDASOMA, N. C. P.,
Chief Minister and Minister of
Law and Order, Finance and Planning,
Provincial Administration and
Personnel, Land, Irrigation and
Agriculture, North Central Province

Anuradhapura,
30th December, 1990.

01–192/2

FINANCIAL STATUTE No. 13 OF 1990

Provincial Council North Central Province

ORDER UNDER SECTION 5 (I)

BY virtue of the powers vested in me by Section 5 (I) of the Financial Statute No. 13 of 1990 Provincial Council, North Central Province, I Gamage Don Mahindasoma, Chief Minister and Minister of Law and Order, Finance and Planning, Provincial Administration and Personnel Land, Irrigation and Agruclture, North Central Province, Provincial Council do by this order with effect from 1st January, 1991 exempt the following from Turnover Tax :—

(a) Any Business for the export of any manufactured or processed article ;
(b) Any Government Department except than where such a Department carries on a business ;
(c) Any local authority.

G. D. MAHINDASOMA, N.C.P.,
Chief Minister and Minister of
Law and Order, Finance and
Planning, Provincial Administration,
and Personnel, Land, Irrigation,
North Central Province, Provincial Council.

Anuradhapura,
30th December 1990.

01–192/3

---

FINANCIAL STATUTE No. 13 OF 1990

Provincial Council North Central Province

ORDER UNDER SE CTION (8)

BY virtue of the Powers vested n me by Sections (8) of the Finano al Statute No. 13 of 1990 Provincial Council, North Gentral Province, I Gamage Don Mahindasoma, Chief Minister and Minister of Law and Order, Finance and Planning,Provincial Administration and Personnel, Land, Irrigation and Agriculture, North Central Province, Provincial Council do by this order with effect from 1st January, 1991 declare the following articles to be exempted articles :—

(a) Books (excluding magazines, Periodicals and Newspapers)
(b) Bread ;
(c) Cardamoms;
(d) Cinnemon ;
(e) Cloves ;
(f) Crude oil and Aviation Fuel ;
(g) Pharmaceutical Drugs ;
(h) Green Leaf ;
(i) Nutmeg ;
(j) Papain ;
(k) Pepper ;
(l) Rubber ;
(m) Petrol sold to diplomatic missions and to members of the diplomatic staff of such missions
(n) Water sold by the Water Supply and Drainage Board or by any local authority ;
(o) Jewellery and Gems sold for payment in foreign currency, if sold by any person authorised by the Central Bank of Sri Lanka to deal inforeign currency.

G. D. MAHINDASOMA, N. C. P.
Chief Minister and Minister of Law and Order, Finance and Planning,
Provincial Administration and Personnel, Land, Irrigation and
Agriculture North Central Province, Provincial Council.

Anuradhapura,
30th December, 1990.

01-192/4

---

FINANCIAL STATUTE No. 13 OF 1990

Provincial Council North Central Province

ORDER UNDER SECTION 76(I)

BY virtue of the powers vested in me by Section 76(I) of the Financial Statute No. 13 of 1990, Provincial Council, North Central Province, I, Gamage Don Mahindasoma, Chief Minister and Minister of Law and Order Finance and Planning, Provincial Administration and Personnel, Land, Irrigation and Agriculture, North Central Province, Provincial Council do by this order with effect from 1st January, 1991, declare that the adhesive stamps described in this order be used for the payment of Stamp Duty on the instruments and documents referred to in Section 37(a), (b) and (c) of that statute.

Adhesive stamps of the denomination of Rupees 50 (Fifty), Rupees 100 (One Hundred) Rupees 500 (Five Hundred) and Rupees 1000 (One Thousand) already issued by the Government of Sri Lanka and overprinted with the English letters, (N. C. P. P. C.)

G. D. MAHINDASOMA, N. C. P.
Chief Minister and Minister of Law and Order, Finance and Planning
Provincial Administration and Personnel, Land Irrigation,
Agriculture, North Central Province, Provincial Council.

Anuradhapura,
30th December, 1990

01-192/5

FINANCIAL STATUTE No. 13 OF 1990

Provincial Council North Central Province

ORDER UNDER SECTION 96(I)

BY virtue of the powers vested in me by section 96(I) of the Financial Statute No. 13 of 1990, Provincial Council, North Central Province, I, Gamage Don Mahindasoma, Chief Minister and Minister of Law and Order, Finance and Planning, Provincial Administration and Personnel, Land, Irrigation and Agriculture, North Central Province, Provincial Council do by this order with effect from 1st January, 1991, fix a rate of tax of 5 per centum.

G. D. MAHINDASOMA, N. C. P,

Chief Minister and Minister of Law and Order, Finance and Planning, Provincial Administration and Personnel, Land, Irrigation and Agriculture, North Central Province, Provincial Council.

Anuradhapura,
30th December, 1990

01-192/6

---

FINANCIAL STATUTE No. 13 OF 1990

Provincial Council North Central Province

REGULATION made by the Chief Minister and Minister of Law and Order, Finance and Planning, Provincial Administration and Personnel, Land, Irrigation and Agriculture, North Central Province, Provincial Council, under Section 77(1) (a) of the Financial Statute No. 13 of 1990, read with Section 37 of that statute.

G. D. MAHINDASOMA, N.C.P.,

Chief Minister and Minister of Law and Order, Finance and Planning, Provincial Administration and Personnel, Land, Irrigation and Agriculture North Central Province, Provincial Council.

Anuradhapura,
30th December, 1990

REGULATION

Stamp duty shall be chargeable with effect from 1st January, 1991.

(a) on every instrument specified in Column I of the schedule hereto at the rates specified in the corresponding entry in Column II of that schedule ; and

(b) on every document specified in Column I of the Schedule hereto at the rates specified in the corresponding entry in Column II of that schedule.

SCHEDULE

| Item No. | Column I | Column II Rs. C. |
|---|---|---|
| 1(1) | Deed or instrument for the exchange of any property otherwise than between co-heirs— | |
| | 1(a) if of equal value, the same duty as on a conveyance of such property at the market value thereof ; | |
| | 1(b) if of unequal value, the same duty as on a conveyance of the property which is of the higher value, at the market value thereof :— | |
| (2) | Deed or instrument for the exchange of any property between co-heirs. | |
| | (a) if of equal value .. .. .. .. .. .. | 10 0 |
| | (b) if pecuniary consideration for equality is given the same duty as on a conveyance of a property the value of which is equal to the market value of the properties exchanged | |
| 2. | Gift or Deed of gift of any property— | |
| | (a) When the value of the property is Rs. 50,000 or less for every Rs. 100 or part thereof .. | 3 0 |
| | (b) When the value of the Property exceeds Rs. 50,000 On the first Rs. 50,000 .. .. | 1,500 0 |
| | On every Rs. 100 of the value in excess of and Rs. 50,000 .. .. .. | 2 0 |
| 3. | (a) Transfer or conveyance of any immovable property, otherwise than by way of gift, not includings transfer or conveyance of such property, without consideration by an executor or administrator of an estate of a deceased to a person beneficially entitled to such property or to a trustee appointed under the will of the deceased, or by a trustee to a beneficiary or by an order of court, in matrimonial proceedings— | |
| | (i) for every Rs. 100 of the value not exceeding Rs. 100,000 .. .. | 3 0 |
| | (ii) for every Rs. 100 or part thereof of the value in excess of Rs. 100,000 .. .. | 4 0 |
| | (b) Transfer or conveyance of any movable property, otherwise than by way of gift, not includihg a transfer or conveyance of such property, without consideration, by an executor or administrator of an estate of a deceased to a person beneficially entitled to such property or to a trustee appointed under the will of the deceased or by a trustee to a beneficiary or by an order of the court in matrimonial proceedings- for every Rs. 100 if part there of the value .. .. .. .. .. | 3 0 |
| 4. | In respect of each Documents filed in Civil proceeding instituted in the Supreme Court or in the Court of Appeal or in the High Court when excercising admiralt jurisdiction : | |
| | (a) Where the value of the proceedings does not exceed Rs. 1,000,000 for every Rs. 1,000 or part thereof | 2 0 |
| | (b) Where the value of the proceedings exceeds Rs. 1,000,000 .. .. .. | 2,000 0 |
| 5. | In respect of each documents filed in Civil proceedings instituted in a District Court .. .. | |
| | (a) Where the value of the proceedings does not exceed Rs. 1,000,000 for every Rs. 1,000 or part thereof | 1 0 |
| | (b) Where the value of the proceedings exceeds Rs. 1,000,000 .. .. .. | 1,000 0 |

01—192/7

PRINTED AT THE DEPARTMENT OF GOVERNMENT PRINTING, SRI LANKA